**උක් පර්යේෂණ ආයතනය - 2016**

------------------------------------

උක් පර්යේෂණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 19 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ගනුදෙනුවක්, සිද්ධියක් කෙරෙහි ව්‍යවහාර වන නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාර කළ යුතු වුවද රු.252,695 ක්වූ ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ආයතනය අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ආයතනය සම්බන්ධව ඇති නඩු දෙකක වර්තමාන තත්ත්වය සලකා බලා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පවතින අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන් කිරීමක් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී වැරදීමකින් ගිණුම්ගත කරන ලද කන්තලේ සීනි සමාගමෙන් අයවිය යුතු ණය සඳහා පොලී මුදල වන රු.385,333 සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් කටයුතු අවසන් වූ රු.250,000 ක් වටිනා ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර වර්ෂ 4 ක පමණ කාලයක සිට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

(ඇ) කොළඹ කාර්යාලය සඳහා ගෙවා ඇති මාස 2 ක ආරක්ෂිත තැන්පතු රු. 300,000 ක මුදල වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර ලැබිය යුතු ආරක්ෂිත තැන්පතු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයෙන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ රු. 50,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය වැඩියෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

සෙවනගල සීනි කර්මාන්ත ආයතනයෙන් ලැබිය යුතු රු. 1,164,231 ක් සහ ලංකා සීනි පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු රු.172,834 ක් වර්ෂ 5 ක කාලයක සිට හා වර්ෂ 5 කට වඩා පැරණි කන්තලේ සීනි සමාගමෙන් ලැබිය යුතු රු. 1,000,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>(අ) 9.12 ඡේදය | ඕනෑම සුභසාධක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ආයතනය විසින් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයන්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 11,346,000 ක වියදමක් දරා තිබුණි. |
| (ආ) 9.14.2 ඡේදය | ආයතනයේ කාර්යයන් සිදු කිරීම සඳහා සකස්කර භාවිතා කරනු ලබන රීති මාලාව (කාර්යය සංවිධාන සංග්‍රහය) සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 88,198,790 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 56,438,274 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 31,760,516 ක වර්ධනයක් විය. මෙහෙයුම් ආදායම රු. 33,706,755 කින් වැඩි වීම ඉහත වර්ධනයට හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 සහ 2013 වර්ෂවල ඌනතාවයක් ඇති වී තිබුණද 2014, 2015 සහ 2016 වර්ෂවලදී අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ස්ථාවර වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.105,963,090 ක්ව පැවති ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු.312,417,371 ක් වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සේවයෙන් පහ කිරීම හා සේවය අවසන් කිරීම හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකු විසින් ආයතනයෙන් වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව නඩු 02 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1981 අංක 75 දරන උක් පර්යේෂණ පනත අනුව ආයතනයේ අරමුණු වනුයේ උක් වගා කිරීම සහ නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම වුවත් උක් කර්මාන්තය දියුණු කිරීම සඳහා නව උක් ප්‍රභේද හඳුන්වා දීම, වගා කටයුතු සඳහා පොහොර නිර්දේශ ලබාදීම, පලිබෝධ සහ රෝග මර්ධනය, ගොවිතැන් යාන්ත්‍රීකරණය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම වැනි කාර්යයන් ද ඉටු කරනු ලැබේ.

(අ) සුදුසු උක් ප්‍රභේද හඳුන්වාදීම, රෝග පාලනය, උක්වගා ක්‍රමවේද හා සීනි උකහා ගැනීම් ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හඳුන්වාදීම මන්දගාමී අයුරින් සිදුවී තිබීම හේතුවෙන් උක් පර්යේෂණ ආයතනය පිහිටුවා දැනට වසර 33 ක් පමණ ගත වී තිබුණද මුළු සීනි අවශ්‍යතාවයෙන් දේශීය සීනි නිෂ්පාදනය සියයට 9 ක් පමණ අඩු ප්‍රමාණයක පැවතුණි.

(ආ) උක් අස්වැන්න නෙළීමේදී පවතින ශ්‍රම සැපයුමේ ඌනතාවයට පිළියමක් ලෙස නවීන තාක්ෂණය අනුව නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම සහ ඒවා භාවිතා කිරීම පිළිබඳ ගොවියන් දැනුවත් කිරීම තුළින් ගුණාත්මක උක් ඵලදාවක් ලබාගැනීම සඳහා ප්‍රමාණාත්මක දායකත්වයක් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළ පර්යේෂණ ව්‍යාපෘති 19 කින් පර්යේෂණ ව්‍යාපෘති 17 ක්ම අත් කර ගෙන තිබුණේ සියයට 5 සිට සියයට 75 දක්වා අඩු භෞතික ප්‍රගති මට්ටමකි. එමෙන්ම CI/9/16 Preliminary evaluation of sugarcane varieties සහ PT/03/16 Testing sugarcane varieties for jiggery production යන ව්‍යාපෘති දෙකෙහි භෞතික ප්‍රගතියක් නොතිබුණි.

(ඈ) දෙනියාය එන්සාල් වත්තේ හෙක්ටයාර 5.4 ක, කන්තලේ හෙක්ටයාර 200 ක සහ කිලිනොච්චියේ හෙක්ටයාර 12 ක ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමකින් තොරව පර්යේෂණ ආයතනය විසින් වසර ගණනාවක සිට එම ඉඩම්වල උක් තවාන් සහ පර්යේෂණ කටයුතු සිදු කරමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ද පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් රු. 20,350,242 ක් වැය කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට කිලිනොච්චි ඉඩමේ අක්කර 8ක්ද කන්තලේ ඉඩමේ හෙක්ටයාර 35ක් පමණක් වගා කර තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු ගොඩනැගිල්ලක් බාහිර පාර්ශවයකට ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා 2004 වර්ෂයේ සිට කුලී පදනම මත ලබා දී තිබූ අතර ඒ සඳහා වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීම් නොකර වර්ෂ දෙකකට වරක් ටෙන්ඩර් කැඳවීම් කර තිබුණි. තවද මෙම ආපන ශාලාවේ පාවිච්චි කරනු ලබන ජලය වෙනුවෙන් ගාස්තුවක්ද ආයතනය විසින් අයකරගෙන නොතිබුණි.

(ආ) 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව දේශීය සීනි නිෂ්පාදන ආයතන විසින් නිෂ්පාදිත සීනි ප්‍රමාණය මත සෙස් බද්දක් අයකළ යුතු වුවද ගල්ඔය සීනි කර්මාන්තායතනයෙන් රු. 1,077,100 ක සෙස් බද්දක් අයකර නොතිබුණි.

(ඇ) ආයතනයේ සංචිතය සතුව වාහන 27ක් ඇති අතර එම වාහන වලින් වාහන 04 ක් ධාවනයට සුදුසු තත්ත්වයේ නොපවතින බව දන්වා තිබුණද ඒවා අපහරණය කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------

2000 වර්ෂයේදී උක් පර්යේෂණ ආයතනය විසින් නිසි අවශ්‍යතාවයකින් තොරව ඩිෆෙන්ඩර් රථයක් මිලදී ගෙන තිබූ අතර 2010 වර්ෂයේ දී එම රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් එය විකිණීමට ඉංජිනේරු විසින් නිර්දේශකර තිබියදී 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.3,035,070 ක අධික වියදමක් දරා මෙම රථය අලුත්වැඩියා කර තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

කොළඹ කාර්යාලය සඳහා රු.85,000 ක මාසික කුලියකට පෙර වර්ෂයේදී භාවිත කල ගොඩනැගිල්ල වෙනුවට ගොඩනැගිල්ලක් ලබා ගැනීමට අදාල පුවත්පත් දැන්වීම අනුව වර්ග අඩි 2,000 ත් 3,000 ත් අතර ප්‍රමාණයක ගොඩනැගිල්ලක් අවශ්‍ය බව දන්වා තිබුණද, ඊට පටහැනිව වර්ග අඩි 5,000 ක ගොඩනැගිල්ලක් මාසිකව රු.150,000 ක කුලියට ලබාගෙන ඒ සඳහා වාර්ෂික කුලිය සහ මාස 2 ක ආරක්ෂිත තැන්පතුවක් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.2,100,000 ක මුදලක්, බදු ගිවිසුම අත්සන් කිරීමට පෙර එකවර ගෙවා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 193 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 176 ක් වීමෙන් තනතුරු 13 ක් සඳහා පුරප්පාඩු 17 ක් පැවතුණි.

(ආ) ප්‍රධාන පර්යේෂණ නිලධාරි, ප්‍රධාන තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ජ්‍යෙෂ්ඨ තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි, තාක්ෂණ නිලධාරී ආදී තනතුරු පුරප්පාඩුව පැවතීම ආයතනයේ මූලික අරමුණ වන පර්යේෂණ කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට අපහසු වී තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනයේ පරිපාලන කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන කාර්ය සංවිධාන සංග්‍රහය අනුමත කර නොගැනීම. |
| (ආ) ආදායම් රැස්කිරීම | නිවැරදි තොරතුරු ලබාගෙන සෙස්බදු ආදායම ගණනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ණය මුදල් අය කිරීම | දීර්ඝකාලීනව අය නොවී පවතින ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |